**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.2,571,438 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී රු.73,678 ක් වූ ලද වට්ටම ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | වට්ටම් මුදල නිවැරදිව තහවුරු කර ගැනීමෙන් පසුව ගිණුම්ගත කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.5,133,667 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට පවතින රු.761,993 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඈ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) වර්ෂ 06 සිට වර්ෂ 09 දක්වා වූ කාල පරාසයක් තුළ අය නොවී පවතින රු.881,780 ක් වූ ගිණුම් ශේෂ 04 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) මහ හපුගල එළ හරක් මස් කඩය 2002 වර්ෂයේ සිට වසා දමා පැවති අතර, එයින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තුව රු.979,477 ක් විය. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | | |
| (i) රීති 59 | - | සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පිළියෙල කර නොතිබුණි. | | |
| | (ii) රීති 143 | - | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව තුලනය කර ප්‍රධාන ලෙජර ගිණුමේ ශේෂය සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ආ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 05 ඡේදය | - | කඩ කාමර බදුදීම සම්බන්ධයෙන් වූ සෑම ගිවිසුමක්ම වසර තුනකට වරක් යාවත්කාලීන කළයුතු වුවද, කලේගාන පොල කඩ කාමර 17 හි ගිවිසුම් 2013 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,291,212 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.31,757,820 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුග ත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,969,000 | 13,678,198 | 10,659,167 | 41,858,398 | 15,300,000 | 14,078,528 | 11,582,072 | 36,473,743 |
| කුලී | 4,987,000 | 5,099,370 | 4,936,452 | 2,890,264 | 3,800,000 | 4,972,324 | 5,171,061 | 2,731,867 |
| බලපත්‍ර ගාස්තු | 335,100 | 537,888 | 519,951 | 24,225 | 402,000 | 592,276 | 630,276 | 4,750 |
| වෙනත් ආදායම් (ගාස්තු) | 7,282,000 | 6,838,194 | 6,821,475 | 63,305 | 8,203,000 | 5,230,300 | 5,160,196 | 58,890 |
| | 26,573,100 | 26,153,650 | 22,937,045 | 44,836,192 | 27,705,000 | 24,778,628 | 22,543,605 | 39,269,250 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.26,573,100 ක් වූ අතර, බිල් කළ ආදායම රු.26,153,650 ක් විය. වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.65,422,900 ක් වුවද, රැස් කළ ආදායම රු.22,937,045 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 35 ක් වී තිබුණි. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

**වරිපනම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 18 ක් වීමෙන් බදු අය කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. දේපළ තහනමට ලක්කර හිඟ අයකර ගැනීමට කටයුතු නොකිරීම මෙම තත්ත්වය උද්ගත වීමට හේතු වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ රැස් කළයුතු සමස්ථ බදු කුලී ආදායම රු.7,831,237 ක් වුවද, රැස්කළ ආදායම රු.4,936,452 ක් වීමෙන් බදු කුලී ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 63 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,174,293 ක් හා මුද්දර ගාස්තු රු.167,885,277 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) කිතුලම්පිටිය එගොඩවත්ත ගල්කැටියවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට රු.442,378 ක් ගෙවීම් කර තිබුණ ද, මාර්ගයේ ඉදිකර තිබූ බෝක්කුවෙහි පැති බැම්මෙහි ගල් ගැලවීමෙන් මාර්ගය අවදානම් තත්ත්වයට පත්ව තිබුණි. | කර්මාන්ත නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. | කර්මාන්තය සිදුකර කාලයක් ගතවීම නිසා මාර්ගය ගිලා බැස ඇත. |
| (ii) මවුන්ට් ප්ලසන්ට් වත්ත ප්‍රධාන මාර්ගයේ පැති කාණුව සංවර්ධනය කිරීම සඳහා රු.1,973,514 ක් ගෙවා තිබුණි. මාර්ගයේ ස්ථාන 04 ක් මාර්ගයට තිරස්ව පුපුරා ගොස් තිබූ අතර, කාණු පද්ධතිය මාර්ගයට වඩා උස්ව පැවතීමෙන් ජලය බැස යාමක් සිදු නොවී මාර්ගය මතුපිට ජලය රැස්ව තිබුණි. | කර්මාන්ත නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. | වැහැරුම් තහඩුවල ඝණකම නිසා පාරට වඩා උසින් පිහිටා ඇත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා | තිරසර සංවර්ධන සඳහා වන | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන |

| | | |
|---|---|---|
| වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක වර්ග 02 කට අදාළව සේවකයන් 07 දෙනෙකුගේ පුරප්පාඩු සහ සේවකයන් 07 දෙනෙකුගේ අතිරික්තයක් විය. | පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව විසින් අනියම්, තාවකාලික, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.3,360,672 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ආදේශක සේවකයන් විධිමත් කරගත යුතු වේ. | දැනට සිටින කම්කරුවන් ප්‍රමාණවත් නොවීම නිසා බඳවාගෙන සභා අරමුදලින් වැටුප් ගෙවා ඇත. |
| (ආ) | සභාවේ සේවය කර විශ්‍රාම ගිය, මිය ගිය හා වර්තමාන සේවා ස්ථානය හඳුනාගත නොහැකිවීම යන හේතු නිසා සේවකයින් 08 දෙනකුගෙන් වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පවතින රු.213,889 ක ණය ශේෂ හා ඉකුත් වර්ෂයේ වැඩ තහනමට ලක් වූ විදුලි කාර්මිකයකුගෙන් අයවිය යුතු රු.100,122 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1999 වර්ෂයේ බදු දී තිබූ ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 32 ක ගිවිසුම් නැවත අළුත් කර නොතිබුණි. මේ හේතුවෙන් රු.269,115 ක් වූ කඩ කුලී හා රු.30,260 ක් වූ කඩ කුලී දඩ මුදල් අයකර ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | බදු ගිවිසුම් යාවත්කාලීන කර, හිඟ කඩ කුලී අයකර ගතයුතු වේ. | ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කලේගාන පොළ කඩ කාමර පිළිබඳ සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 20 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී කඩ කාමර 11 ක නිසි නඩත්තුවක් නොවීම හා යටිතල පහසුකම් නොතිබීම හේතුවෙන් වසා දමා තිබුණි. මෙම කඩ කාමර අළුත්වැඩියා කර, නව ගිවිසුම් යටතේ බදු දීමෙන් සභාවේ බදු ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වේ. | කඩ බදු නොගෙවන කඩ හිමියන්ගේ ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභා බල ප්‍රදේශය තුළ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05 ක් පැවති අතර, 2016 දෙසැම්බර් 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව මෙම කුළුණු සඳහා ගාස්තු අයකර නොගැනීමෙන් රු.15,000 ක පාඩුවක් සභා අරමුදලට සිදු තිබුණි. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලින් වාර්ෂිකව බදු අයකළ යුතු වේ. | ඉදිරියේ දී නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය හා සභා අරමුදල් යොදවා රු.4,050,000 කට මිලට ගෙන තිබූ බැකෝ යන්ත්‍රය වර්ෂයකට අධික කාලයක් සභා පරිශ්‍රය තුළ ධාවනයෙන් තොරව ගාල්කර තැබීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 18 දින අළුත්වැඩියාව සඳහා යොමු කර තිබුණ ද, 2019 මාර්තු 25 දින වන විටත් අළුත්වැඩියාව නිමකර නොතිබුණි. | නඩත්තු කටයුතු කඩිනමින් සිදුකළ යුතු වේ. | මේ වන විට අළුත්වැඩියා කටයුතු නිම වී ඇත. |

**3.4.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී ඇති ජල බවුසරය හා කම්පැක්ටරය හා ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ ට්‍රැක්ටරයෙහි අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අයිතිය සභාව වෙත පවරා ගත යුතු වේ. | ඉදිරියේ දී පවරා ගැනීමේ කටයුතු සිදු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරමි. |

**3.5.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍යතාවය හඳුනා ගැනීමක් නොමැතිව හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකොට රු.279,000 ක් වැයකර කාර්යාල පුටු 25 ක් මිලදී ගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මිල ගණන් කැඳවීමේ දී පිරිවිතරවල නිවැරදි විස්තර ඉදිරිපත් කළ යුතු වේ. | ඇගයීම් කමිටුව විසින් මිල ගණන් සැසඳීමෙන් හා ඇණවුම් කිරීමෙන් පසු සැපයීම ආදී කරුණු විශ්ලේෂණය කර මිලදී ගැනීම් සිදු කළෙමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයක රු.360,000 ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සියයට 100 ක් ම ඉතිරි වී තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ආ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු.30,192,729 ක් වූ ඉතිරිවීම් වූ අතර, එම අගයයන් සියයට 30 සිට සියයට 63 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ.<br>තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි.<br>ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ඇ) | වියදම් විෂයයක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.257,708 ක් හෙවත් සියයට 525 ක් වියදම් දරා තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ |

| | | |
|---|---|---|
| (ඇ) එක් ආදායම් විෂයයක අහිතකර විචලනය රු.1,277,419 ක් හෙවත් සියයට 55 ක් විය. | | සම්බන්ධයෙන් කටයුතු කරමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේ දී විගණකාධිපතිවරයාගෙන් විමසීම් කර නොතිබුණු අතර, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |